# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1581/2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023
දිනය / திகதி / Date – 16/12/2023 පැය 0750

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2023.12.15 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 60 | 100 | යතුරු පැදි 01<br>තඹ දඟර 01<br>ගෑස් ලිප් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල අදාළ පොලිසියට ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2023.12.15 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ කොටිකාවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 610 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 30 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකාරියකි. වැල්ලම්පිටිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2023.12.15 වන දින සවස් කාලයේ කුඹුක්ගැටේ පොලිස් වසමේ තිත්තවැල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 24 මිලිග්‍රෑම් 650 ක් සහ ජාවාරමෙන් උපයාගත් මුදල් රුපියල් 9000/- ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කුඹුක්ගැටේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කුඹුක්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. කුඹුක්ගැටේ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

2023.12.15 වන දින උදෑසන කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ රන්දොඹේ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 850 ක් සහ මන්නා පිහියක් සහ මුදල් රුපියල් 53,350/- ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අම්බලන්ගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2023.12.15 වන දින රාත්‍රි කාලයේ මොරන්තුඩුව පොලිස් වසමේ දැල්කඩ හන්දිය අසලදී පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මොරන්තුඩුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන ගෝනපල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මොරන්තුඩුව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් පතල් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2023.12.15 වන දින සවස් කාලයේ නිවිතිගල පොලිස් වසමේ මුත්තෙට්ටුව කුඹුර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **ස්කැවේටර් යන්ත්‍රයක් උපයෝගී කරගෙන බලපත්‍ර උල්ලංඝණය කරමින් පතල් කැණීම් කරමින් සිටි**

**සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 48 වයස්වල පසුවන කුලියාපිටිය හා නිවිතිගල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**